SJSW 2025 9(2): 33-45

Sri Lanka Journal of Social Work (SJSW)
Volume 09 – Issue 02

02

# ECONOMIC ISSUES AND CHALLENGES AFFECTING THE LIFE SUSTAINABILITY OF THE ELDERLY COMMUNITY

## වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසරභාවය කෙරෙහි බලපා ඇති ආර්ථික ගැටලු හා අභියෝග

**Hettiarachchi, P.C.**
National Institute of Social Development, Liyanagemulla, Seeduwa, Sri Lanka
Email: hettipriya250@gmail.com

## ABSTRACT

*Population aging has become a significant social challenge in both developed and developing countries. Sri Lanka is experiencing a rapid increase in its elderly population, at a rate that exceeds that of many other Asian nations. A key concern is that this demographic shift is not accompanied by corresponding economic growth. Consequently, a large proportion of older adults are facing financial difficulties and economic insecurity.This study aims to identify the economic problems and challenges faced by the elderly population and to propose sustainable economic approaches and strategies to improve their quality of life. A mixed-method research design was employed. A total of 350 older adults from the Southern Province were selected using proportional sampling. Survey and case study methods were used, supported by questionnaires, in-depth interviews, and direct observation to collect primary data. Secondary data were obtained from relevant published sources. Quantitative data were analyzed using descriptive statistics, while qualitative data were analyzed thematically.The findings reveal that a lack of financial capital significantly undermines the life sustainability of older adults. Economic insecurity emerged as the most critical challenge faced by the elderly. Of the total sample, 35.0% reported having no monthly income, while 54.0% depended on government welfare programs, children, or relatives for financial support. Additionally, 69.0% reported having no savings. Female widowed elders represent the most economically vulnerable subgroup. The study highlights the importance of interventions that improve access to financial capital and strengthen economic support systems, thereby enhancing the sustainability and well-being of the elderly community.*

**KEYWORDS:** *Aging, elderly population, economic problems, economic insecurity, life sustainability*

**සාරසංක්ෂ්පය**

*වැඩිහිටි ජනගහන වර්ධනය සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවත්නා සෑම රාජ්‍යක්ම මුහුණ දී ඇති සමාජ ගැටලුවකි. ආසියානු කලාපයේ සෙසු රටවල් අභිබවමින් ලාංකේය සමාජයේ වැඩිහිටි ජනගහනය සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් තිබේ. එහි දී හඳුනාගත හැකි සුවිශේෂීත්වයක් වී ඇත්තේ වැඩිහිටි ජනගහන වර්ධනයට සාපෙක්ෂව ආර්ථික වර්ධනයක් සිදු නොවීමයි. මේ හේතුවෙන් වැඩිහිටි ප්‍රජාව ආර්ථික ගැටලු හා අභියෝග රැසකට මුහුණ දී සිටී. මෙහි පර්යේෂණ පරමාර්ථය වැඩිහිටි ප්‍රජාව මුහුණ දෙන ආර්ථික ගැටලු හා අභියෝග හඳුනාගනිමින්, වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසාරභාවය කෙරෙහි ගළපාගත හැකි නව ආර්ථික ප්‍රවේශතා හා උපායාමර්ග හඳුනාගැනීමයි. පර්යේෂණ ක්‍රමවේදය මිශ්‍ර ක්‍රමවේදාත්මකය. නියැදිය වශයෙන් වැඩිහිටියන් 350 සංඛ්‍යාවක් සමානුපාතික විභේදනය යටතේ දකුණු පළාත ඇසුරෙන් තෝරා ගෙන ඇත. පර්යේෂණ විධික්‍රමය සමීක්ෂණ හා ප්‍රත්‍යක්ෂ විධික්‍රමය විය. ප්‍රාථමික දත්ත රැස්කිරීමට ප්‍රශ්ණාවලිය, ගැඹුරු සම්මුඛ සාකච්ඡාව, නිරීක්ෂණය යන ශිල්ප ක්‍රම යොදාගත් අතර පර්යේෂණ ප්‍රශ්තුතය හා බැඳි මූලාශ්‍ර රැසකින් ද්විතික දත්ත ද රැස් කෙරිණි. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේශණයට විස්තරාත්මක සංඛ්‍යානයත්, ගුණාත්මක දත්ත විශ්ලේශණය සඳහා තේමා විශ්ලේශණයත් භාවිතා විය. පර්යේෂණ සොයාගැනීම් අනුව වැඩිහිටියන්ගේ මූල්‍ය ප්‍රාග්ධන විහිනතාවයන් හේතුවෙන් ජීවන තිරසරභාවයට සෘණාත්මක බලපෑමක් වී තිබේ. ආර්ථික අනාරක්ෂිතභාවය වැඩිහිටි ප්‍රජාව මුහුණ දෙන ප්‍රමුඛ ගැටලුව වී ඇත. කිසිදු මාසික ආදායමක් නොමැති වැඩිහිටියන් මුළු නියැදියේ 35.0%කි. වැඩිහිටියන් 54.0% ප්‍රමාණයක් රජයේ සුභසාධන දිමනා හා සිය දරුවන් හා ඥාති පාර්ශවයන් තුළින් යැපෙන වැඩිහිටියන්ය. සමස්ත නියැදියෙහි ජීවත්වන වැඩිහිටියන් බහුතරයක් ඉතිරි කිරීම් නොමැති අය වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 69.0% ප්‍රමාණයකි. වැඩිහිටියන් අතුරින් බහුතරයකට ආර්ථිකමය සහයෝගීතාවයක් නොලැබීම තුළ අනාරක්ෂිතභාවයකට ද පත් වී සිටී. මේ අතුරින් පුරුෂ වැඩිහිටියන් හා සාපේක්ෂව ස්ත්‍රී වැන්දඹු වැඩිහිටයන් වඩාත් ආර්ථික අනාරක්ෂිතභාවයකට පත්ව සිටින පාර්ශවය වී ඇත. වැඩිහිටි ප්‍රජාවට මූල්‍ය ප්‍රාග්ධන ප්‍රවේශතා සඳහා අවකාශය සැපයෙන මැදිහත්වීම් තුළ ආර්ථික තත්ත්වය සක්‍රීය කරමින් ජීවන තිරසරභාවය යන්න යථාර්තයක් බවට පත් කරළිය හැකිය.*

**ප්‍රමුඛ පදඃ** වයස්ගතවීම, වැඩිහිටි ප්‍රජාව, ආර්ථික ගැටලු, ආර්ථික අනාරක්ෂිතභාවය, ජීවන තිරසරභාවය.

## 1. හැඳින්වීම

ජනගහනයක සිටින වයස්ගත වුවන්ගේ ප්‍රතිශතය මුළු ජන සංඛ්‍යාවට සාපේක්ෂව වැඩි වර්ධනය වීම ජනගහනය වයස්ගතවීමයි. වයස අවුඃ65 හෝ ඊට වැඩි පිරිස සංවර්ධිත රටවල වැඩිහිටි ජනගහනය ලෙස සළකා තිබෙන අතර, සංවර්ධනය වෙමින් පවත්නා රටවල මෙම වයස් සීමාව අවුඃ60 හෝ ඊට වැඩි පිරිස වශයෙන් නම් කොට ඇත. එක්සත් ජාතීන්ගේ ජනගහන ඇස්තමේන්තු (2005) අනුව 1980 දශකයේ සිටම වේගවත් වයස්ගතවීමේ ක්‍රියාවලිය සිදු වෙන දකුණු ආසියාතික රටක් වශයෙන් ලාංකේය සමාජය හඳුනාගෙන තිබේ. දකුණු ආසියානු කලාපයේ රටවල වයස්ගත ජනගනය හා මධ්‍යයනය වයස පිළිබඳ වන 2012 සහ 2022 ජනගහන විද්‍යාත්මක දත්ත වාර්තාවන්ට අනුව පෙනවා දී ඇත්තේ ද වයස අවුඃ 60-69 අතරත් 70-79 හා වයස අවුඃ 80 වැඩි මහලු වැඩිහිටි ජනගහනය අතරත් බහුතර වැඩිහිටි ප්‍රතිශතයක් ජීවත්වන දකුණු අසියානු කලාපයේ රටක් වශයෙන් ලාංකේය සමාජය ප්‍රමුඛ වී ඇති බවයි. එමෙන්ම ජන

විද්‍යාත්මක දත්තයන්ට අනුව පෙනීයන තවත් සුවිශේෂී කාරණයක් වී ඇත්තේ වයස අවු: 60 වැඩි වැඩිහිටියන් බහුතරයක් ග්‍රාමීය ප්‍රදේශ තුළ ජීවත්වීමයි. ඔවුන් අතුරින් බහුතර වැඩිහිටියන් විවිධ ආර්ථික ගැටලු හා අභියෝගයන්ට මුහුණ පා සිටිති. වැඩිහිටි ජනගහනයේ වර්ධනයට සාපේක්ෂව තරුණ ප්‍රජාවේ කැපී පෙනෙන සංඛ්‍යාත්මක අඩු වීම වැඩිහිටි යැපුම් අනුපාතය ක්‍රමිකව ඉහළ යෑමට බලපෑමක් වී තිබේ. තරුණ ප්‍රජාව විදේශීය රටවලට වැඩි වශයෙන් රැකියා සඳහා සංක්‍රමණය වීමත් මේ තත්ත්වයට බලපා ඇති එක් හේතුවකි. ලාංකේය සමාජය තුළ වැඩිහිටි ජනගහනයේ වයස්ගත ස්ත්‍රීන් බහුල වීමත්, ඔවුන් අතර සිටින වැන්දඹු ස්ත්‍රීන් ඉහළ යෑමත් තුළ පුරුෂ වැඩිහිටියන්ට සාපේක්ෂව ස්ත්‍රී වැඩිහිටියන් වඩාත් සංකීර්ණ ආර්ථික ගැටලු ද අත්විඳිමින් සිටී. වත්මන් ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්ති තුළ වැඩිහිටි ජනගහනය වර්ධනයට සාපේක්ෂව ආර්ථික වර්ධනයක් සිදු නොවීමෙන් රැකවරණ, ආර්ථික මෙන්ම සෞඛ්‍ය හා පෝෂණ ගැටලු ඇති වීමෙන් වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසරභාවය හා යහපැවැත්ම කෙරෙහි එය සුවිශාල අභියෝගයක් වශයෙන් බලපා තිබේ. වයස්ගත වැඩිහිටියන් බහුතරයක් සංවිධිත අංශයේ සේවා නියුක්තිකයින් නොවන බැවින් විශ්‍රාම, අර්ථසාධක හෝ සේවා නියුක්ති භාරකාර අරමුදල වැනි සුරක්ෂිත හිමිකම් නොලබන පිරිසක් වීම හේතුවෙන් වයස්ගතවියේ ජීවන ක්‍රියාවලිය තුළ බොහෝ ගැටලු හා අභියෝගයන්ට මුහුණ දී ඇත. එවැනි පසුබිමක් තුළ වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසරභාවයට ඔවුන් සතු මූල්‍ය ප්‍රාග්ධනය තීරණාත්මක සාධකයක් බවට පත් වී තිබේ. මූල්‍ය ප්‍රාග්ධනය යනු පුද්ගල ජීවන අරමුණු ඉටුකර ගැනීම සඳහා අවැසි මූල්‍ය සම්පත් වේ. රැකියාව, ආදායම් මූලාශ්‍ර, විශ්‍රාම, ඉතුරුම් හා ආධාර තුළින් මූල්‍ය ප්‍රාග්ධන වත්කම් ගොඩනගා ගත හැකිය. එනයින් වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසරභාවය සඳහා අවැසි ආර්ථික ප්‍රවේශතා ගොඩනංවා දීමේ පෘථුල අභියෝගය කුටුම්භ සංස්ථාවේ සිට ජාතික මැදිහත්වීමක් තුළ කළ යුතු කාර්යභාර්යක් වශයෙන් පවතී.

## 2. සාහිත්‍ය විමර්ශනය

2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුව වැඩිහිටි තැනැත්තෙක් යනු වයස අවු: 60 ඉක්ම වූ අයෙකි (වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත, 2000, පි.194). සුමනසේකර (2004) අනුව ස්ත්‍රී වැඩිහිටියන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය පුරුෂයින් හා සාපේක්ෂව පහත් මට්ටමක පවති. පතිරගේ (2013) අනුව වයස්ගත බහුතරයක් වියපත් අවධියේ කිසිඳු පිළිසරණක් නොමැති හා නිතර රෝගී වීමේ ප්‍රවණතාවයක් සහිත අයවලුන් වශයෙන් ජීවත්වේ. Manike (2016) දක්වා ඇත්තේ ග්‍රාමීය හා නාගරික වැඩිහිටියන් බහුතරයක් විවිධ සමාජ-ආර්ථික ගැටලු වලින් පිඩා විඳින බවයි. ආර්ථික දුෂ්කරතාවයන්, සෞඛ්‍ය ගැටලු, නොසළකා හැරීම්, මහලුවියේ ගැටලු පිළිබඳ අනවබෝධය හේතුකොටගෙන ඔවුනගේ ජීවන තත්ත්වන් පිරිහීමකට ලක් වී තිබේ. දිසානායනක (2021) අනුව පශ්චාත් විශ්‍රාම දිවිය වියපත්වුවන් මුහුණ දෙන පිඩාකාරී අත්දැකීමක් බවට පත් වී ඇත. විශේෂයෙන් විශ්‍රාම යෑමත් සමග වැඩිහිටියන් වැඩි වශයෙන් ආර්ථික ගැටලු වලට මුහුණ දී සිටී. Barrintotos et. all (2003) අනුව, වැඩිහිටියන්ගේ දිළිඳුකම යන්න

සංවර්ධනය වෙමින් පවතින රටවල පවත්නා සුවිශේෂී ප්‍රවණතාවක් වී තිබේ. Benserson & Mertlock (2007) අනුව සමාජ අධාරය නොලැබෙන වැඩිහිටියන් බහුතරයකගේ මූල්‍ය වත්කම් සීමා වී තිබේ. Yaseen & Zaman (2017) අනුව වැඩිහිටි පුද්ගලයින්ගේ ආර්ථික ගැටලු හා පවුල් ව්‍යුහයේ සිදු වෙන වෙනස්කම් අතර සහ සහම්බන්ධතාවයක් පවත්නා බවයි. Amiri (2018) අනුව ඉන්දියානු වෙනස්වන සමාජ වතාවරණය හා සම්ප්‍රදය තුළ වැඩිහිටියන් අක්‍රීය, යැපෙන, ආර්ථික වශයෙන් දුර්වල පිරිසක් බවට පත් වී තිබේ. මේ හේතුකොටගෙන වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසරභාවය කෙරෙහි බලපා ඇති ආර්ථික ගැටලු හා අභියෝග පිළිබඳ ලාංකේය සමාජය ඇසුරින් සොයාබැලීමේ අවැසිතාවය පවතී.

### 3. පර්යේෂණ ගැටලුව

මෙහි පර්යේෂණ ගැටලුව වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසාරභාවය කෙරෙහි බලපා ඇති ආර්ථික ගැටලු හා අභියෝග මොනවා ද යන්න ගවේෂණය කරගැනීමයි. වේගවත් ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්ති හේතු කොටගෙන ලාංකේය සමාජය තුළ වයස්ගතවීමේ ක්‍රියාවලිය සුවිශේෂී වී තිබේ. කෙටි කාලයක් තුළ ජන සංඛ්‍යාව සීඝ්‍රයෙන් වියපත්වීමට සාපේක්ෂව ආර්ථික පද්ධතිවල වෙනස්කම් නොවීම හමුවේ වැඩිහිටි ප්‍රජාව ආර්ථික ගැටලු හා අභියෝග රාශියකට මුහුණ දී සිටිනු හඳුනාගත හැකිය.

### 4. පර්යේෂණ පරමාර්ථය හා අරමුණුඃ

මෙම පර්යේෂණ පරමාර්ථය වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසාරභාවය කෙරෙහි බලපා ඇති ආර්ථික ගැටලු හා අභියෝග හඳුනාගනිමින්, එම ප්‍රජාවේ ජීවන තිරසාරභාවයට අවැසි නව ආර්ථික ප්‍රවේශයන් හා උපායමාර්ග නිර්දේශ කිරීමයි. එහි දී පහත සඳහන් සුවිශේෂී අරමුණු සක්ෂාත් කර ගැනීමටත් අපේක්ෂා කර ඇත.

1. වැඩිහිටි ප්‍රජාව මුහුණ දෙන ආර්ථික ගැටලු හා අභියෝග හඳුනාගැනීම.

2. වැඩිහිටි ප්‍රජාව මුහණ දෙන ආර්ථික ගැටලු සඳහා බලපා ඇති සුවිශේෂී හේතු සාධක අනාවරණය කරගැනීම.

3. වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසරභාවය කෙරෙහි බලපා ඇති ආර්ථික ගැටලු හා අභියෝග විශ්ලේශණය කරගනිමින්, එය අවම කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

### 4. පර්යේෂණ ක්‍රමවේදය (Research Methodology)

පර්යේෂණ ක්‍රමවේදය මිශ්‍ර ක්‍රමවේදාත්මකය. වැඩිහිටියන් 350ක සරල සසම්භාවී (සමානුපාතික විභේදනය) යටතේ දකුණු පළාත ඇසුරෙන් තෝරා ගැණුනි. පර්යේෂණ විධික්‍රමය සමීක්ෂණ හා ප්‍රත්‍යෙක විධික්‍රමය විය. ප්‍රාථමික දත්ත රැස්කිරීමට ප්‍රශ්ණාවලිය, ගැඹුරු හා කේන්ද්‍රගත සම්මුඛ සාකච්ඡාව, නියමු තොරතුරු සපයන්නන්, නිරීක්ෂණය යන ශිල්ප ක්‍රම යොදාගත් අතර

පර්යේෂණ ප්‍රස්තුතය හා බැඳි මූලාශ්‍ර රැසකින් ද්විතික දත්ත රැස් කෙරිණි. දත්ත විශ්ලේෂණය විස්තරාත්මක සංඛ්‍යානය, තේමා විශ්ලේෂණයත් යටතේ සිදු විය.


### 5.0 ප්‍රතිඵල හා සාකච්ඡාව

### 5.1 වැඩිහිටි ප්‍රජාවේ ජීවන තිරසරභාවය කෙරෙහි බලපා ඇති ආර්ථික ගැටලු හා අභියෝග

වැඩිහිටි ජීවන පැවැත්ම තුළ ආර්ථික ගැටලු හා අභියෝග ඇති වීම කෙරෙහි මූල්‍ය ප්‍රාග්ධන වත්කම් හා ප්‍රවේශතාවයේ අහිමි වීම හේතුකොට ගෙන ආර්ථික අනාරක්ෂිතභාවයකින් කටයුතු කිරීමට වැඩිහිටියාට සිදු වී තිබේ.

#### 5.1.1 රැකියාවේ ස්වභාවය

**ප්‍රස්තාර අංකः 1.0-වැඩිහිටියන්ගේ රැකියා ස්වභාවය**




**මූලාශ්‍රයः ක්ෂේත්‍ර සමීක්ෂණය, 2024**

ප්‍රස්තාර අංක 1.0 දැක්වෙන අන්දමට නියැදිය තුළ ජීවත්වන ස්ත්‍රී-පුරුෂ වැඩිහිටියන් අතුරින් බහුතරය රැකියාවක් නොකරන ලද අයවලුන් වී ඇත. එය සමස්ත නියැදියෙන් 54.0% ප්‍රමාණයකි. එම පිරිස අතරට වයස අවු: 80ට වැඩි මහළුතම ස්ත්‍රී-පුරුෂ වැඩිහිටියන් ද ඇතුළත්ව සිටී. ස්ත්‍රී හා පුරුෂ වශයෙන් සළකා බැලීමේ දී මුළු නියැදිය තුළ රැකියා නොකරන ලද බහුතර පාර්ශවය ස්ත්‍රී වැඩිහිටියන් වීම ද සුවිශේෂී වී තිබේ. වැඩිහිටියන්ගේ රැකියා තත්ත්වයන්ගේ ස්වභාවය ඔවුනගේ මාසික ආදායම තීරණය වීම කෙරෙහි තීරණාත්මක බලපෑමක් වී තිබේ. සංඛ්‍යා දත්ත අනුව නියැදියේ බහුතරයක් වැඩිහිටියන් රැකියා නොකරන ලද අයවලුන් වශයෙන් හා තවත් පිරිසක් අවධිමත් ක්ෂේත්‍රයට ඇතුළත් අංශයන්හි රැකියා කරන්නන් වශයෙන් විශ්‍රාම වැටුප්, අර්ථසාධක හෝ වෙනත් අරමුදලකට හිමිකම් නොමැති කණ්ඩායමක් වශයෙන් ජීවත් වේ. මේ හේතුවෙන් ඔවුන් සිය රැකියාව ජීවිතය ආශ්‍රිතව ආර්ථික අනාරක්ෂිතභාවයකට පත් වී සිටින බව පැහැදිලිය.

*'මගේ නම සුමනාවතී. මට වයස අවු:60 ක් වෙනවා. මගේ සැමියා මීට වසර 12 පමණ පෙර හෘදයාබාධයකින් මිය ගියා. මට එක් පුතෙකු සිටිනවා. පුතා කොළඹ සුළු රැකියාවක් කරනවා.*


*මට එක් සහෝදරයෙක් හා සහෝදරියක් ද සිටිනවා. සහෝදරිය විවාහ වේලා රත්නපුරේ ඉන්නේ. මගේ එකම සහෝදරයා අබාධිතයි. ඒ නිසා ඔහුට රැකියාවක් කරන්නත් බෑ. ඔහු ජීවත් වෙන්නේත් මා එක්කයි. ඒ නිසා මට කුළියක් කරගන්නවත් විදියක් නෑ. අපි දෙදෙනාට ජීවත් වෙන්න එකම පිළිසරණ තමයි මගේ පුතාගේ රැකියාවෙන් මාසිකව එවන මුදල් හා මට සමෘද්ධි හැටියට ලැබෙන රු.1500 දීමනාව, ඒ නිසා මල්ලීත් බලාගෙන මමත් ජීවත් වෙන්නේ හරි අමාරුවෙන්. මේක කාටත් අමාරු කාලයක් නිසා ඒ අමාරුකම් අපි වගේ මිනිසුන්ට තදින්ම දැනෙනවා."*

***ගැඹුරු සම්මුඛ සාකච්ඡාව, 2024***

මෙම ප්‍රතිචාරක අදහස් තුළින් සනාථ වන්නේ ආර්ථික හැකියාවක් නොමැතිව සිය එකම අබාධිත සහෝදරයාත් රැකබලා ගනිමින් සිය ජීවන පැවැත්ම ගෙනයෑමට සිදු වීමෙන් වැඩිහිටි වැන්දඹු ස්ත්‍රියකට මුහුණ දීමට සිදු වී ඇති ජීවන ගැටලු හා අභියෝගයන්ය. ඒ අනුව දරුවන්ගේ ආදායම් මත යැපෙමින් ආර්ථික අනාරක්ෂිතභාවයකින් ජීවන පැවැත්ම ගෙනයෑමට මෙම වැඩිහිටි කාන්තාවට සිදු වී තිබේ.

### 5.1.2 ආදායම් තත්ත්වය

**ප්‍රස්තාර අංකඃ1.1-වැඩිහිටියන්ගේ මාසික අදායම් තත්ත්වය**




**මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය,** 2024

ප්‍රස්තාර අංක 1.1 අනුව මාසික ආදායම රු.5,000 අඩු ආදායමක් ලබන ස්ත්‍රී හා පුරුෂ වැඩිහිටියන් 19.0% ප්‍රතිශතයක් නියැදිය තුළ ජීවත්වන අතර, ඔවුන් රජයේ විවිධ සුභසාධන දීමනාවන්ට හිමිකම් ලැබූවන් වේ. මෙහි හඳුනාගත හැකි වූ සුවිශේෂීත්වයක් නම් කිසිදු මාසික ආදායමක් නොලබන බහුතර වැඩිහිටියන් පිරිසක් නියැදිය තුළ ජීවත් වී සිටී. සමස්තයක් වශයෙන් එය මුළු නියැදියේ ප්‍රතිශතයක් වශයෙන් 35.0% ප්‍රමාණයකි. මෙහි දී පුරුෂ වැඩිහිටියන් හා සාපේක්ෂව ස්ත්‍රී වැඩිහිටියන්ගේ මාසික ආදායම අවම මට්ටමක පවතී. මේ හේතුවෙන් වඩාත්

ආර්ථික අනාරක්ෂිතභාවයකට ස්ත්‍රී වැඩිහිටියන් පත් වී සිටින අතර ඔවුන් තවදුරටත් සිය දරුවන් හා ඥාතී පාර්ශවයන් මත යැපෙන පාර්ශවය බවට පත් වී සිටී.

### 5.1.3 වැඩිහිටි ප්‍රජාවේ ආදායම් මූලාශ්‍ර

**වගු අංකඃ1.0-වැඩිහිටියන්ගේ ආදායම් මූලාශ්‍ර**

| ආදායම් ප්‍රභවය | ස්ත්‍රී | ප්‍රතිශතය | පුරුෂ | ප්‍රතිශතය | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| රැකියාව | 41 | 18% | 22 | 18% | 63 | 18% |
| විශ්‍රාම වැටුප් | 44 | 19% | 40 | 32% | 84 | 24% |
| රජයේ සුභසාධන දීමනා | 44 | 19% | 22 | 18% | 66 | 19% |
| දේපළ, ව්‍යාපාර, ගිණුම් | 08 | 04% | 05 | 04% | 13 | 04% |
| දරුවන් | 69 | 31% | 30 | 24% | 99 | 28% |
| ඥාති හිතවතුන් | 20 | 09% | 05 | 04% | 25 | 07% |
| **එකතුව** | **226** | **100 %** | **124** | **100%** | **350** | **100%** |

**මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2024**

නියැදියට අනුව ස්ත්‍රී හා පුරුෂ වැඩිහිටියන් අතුරින් 18.0% ප්‍රධාන මාසික අදායම් මූලාශ්‍රය සිය රැකියාව බවට පත් වී තිබේ. ඔවුන් පූර්ණ කාලීනව හා අර්ධ කාලීන වශයෙන් රැකියාගත වැඩිහිටියන්ය. එමෙන්ම ස්ත්‍රී හා පුරුෂ වශයෙන් ජීවත්වන තවත් වැඩිහිටියන් 24.0%ගේ ප්‍රධාන මාසික ආදායම් මූලාශ්‍රය සිය විශ්‍රාම වැටුප බවට පත් වී ඇත. එමෙන්ම රජයේ සුභසාධන දීමනා සඳහා හිමිකම් ලබන ස්ත්‍රී හා පුරුෂ වැඩිහිටියන් 19.0%ක ප්‍රතිශතයක් නියැදිය තුළ වූ අතර, වැඩිහිටි දිමනාව, සමෘද්ධි ප්‍රතිලාභ, පිං පඩි ඔවුනගේ ප්‍රධාන මාසික ආදායම් මූලාශ්‍ර බවට පත් වී තිබේ. සමස්ත නියැදියෙහි 35.0% ප්‍රතිශතයකගේ ප්‍රධාන මාසික අදායම් මූලාශ්‍රයන් බවට පත් වී ඇත්තේ සිය දරුවන් හෝ ඥාති හිතෛෂින් වේ. විශේෂයෙන් සිය දරුවන් හා ඥාති හිතෛෂීන්ගෙන් මසකට ලැබෙන මූල්‍ය උපකාර හා ආධාර ඔවුනගේ එකම අදායම් මූලාශ්‍රයන් බවට පත් වී තිබේ. සමස්ත නියැදිය තුළ හඳුනාගත හැකි වූ තවත් කාරණයක් නම් වැඩිහිටියන් 54.0% ප්‍රමාණයක් දරුවන්, රජයේ සුභසාධන දිමනා හා සිය ඥාතී පාර්ශවයන් තුළින් යැපෙන වැඩිහිටියන් බවට පත් වී ඇත. එම පිරිස අතර බහුතරය ස්ත්‍රී වැඩිහිටියන් වී තිබීමත් සුවිශේෂීත්වයකි. අධ්‍යයන නියැදියෙහි ජීවත්වන වැඩිහිටියන්ගේ මාසික ආදායම් තත්ත්වය හා ඔවුනට ඇති ආදායම් මාර්ග සඳහා වූ ප්‍රවේශතාව හීනවීම හමුවේ ආර්ථික වශයෙන් දුෂ්කරතා හා අභියෝග රැසකට මුහුණ දීමට සිදු වී තිබේ. ගැඹුරු සම්මුඛ සාකච්ඡා ඇසුරින් අනාවරණය කරගත් අන්දමට වැඩිහිටි පුද්ගලයින්ට ස්ථාවර ආර්ථික පසුබිමක් ගොඩනගා ගැනීමට නොහැකි පසුබිම තුළ සිය වයස්ගතවියේ දුගීභාවය වර්ධනය වීමට එය හේතුවක් වී තිබේ.

*'මගේ නම දයාවතී. වයස අවු:69 යි. මහත්තයා නැතී වී දැන් අවුරුදු 12ක් වෙනවා. මට දරුවන් තුන්දෙනෙක් හිටියා. මං කාලයක් තිස්සේ පිළිකා රෝගයකින් පෙළෙනවා. මට කිසිම මාසික*

*ආදායම් මාර්ගයක් නැහැ. ඒ නිසා බේතක් ගන්නත් විදියක් නැහැ. දේපළත් දරුවන්ට ලිව්වා. මං හිතුවා දේපළ ලිව්වමවත් උන් මට සලකාවී කියලා. ඒත් එහෙම වුනේ නැහැ. දරුවන් ලොකු මහත් කරන්න මම සෑහෙන උත්සාහ ගත්තා. ඒත් දරුවන්ට ඒ දේවල් ඔක්කෝම අමතක වෙලා. මං දැන් අන්ත අසරණ තත්ත්වයට පත්වෙලා ජීවත් වෙන්නේ'*

***ගැඹුරු සම්මුඛ සාකච්ඡාව, 2024***

මෙම ප්‍රතිචාරක අදහස් තුළින් පෙනී යන්නේ වැඩිහිටියන්ට සිය වියපත්වියේ කිසිදු ආදායමක් නොමැති පසුබිමක් තුළ විඳීමට සිදු වී ඇති ආර්ථික දුෂ්කරතා හා අභියෝගයන්ගේ ස්වභාවය වේ. තමන්ට පවත්නා දේපළ දරුවන්ට පැවරීම තුළින් දරුවන්ගෙන් වියපත්වියේ අවැසි සහයෝගය ලබාගැනීමට ඇතැම් වැඩිහිටියන් කටයුතු කර තිබුණත්, අවසානයේ දරුවන් විසින් දේපළ පවරා ගැනීමෙන් පසු වයස්ගත දෙමාපියන්ට අවැසි රැකවරණය හා සහයෝගය ලබා නොදෙන පසුබිමක් තුළ වැඩිහිටියන් අසරණ තත්ත්වයට පත් වී ආර්ථික ගැටලු රැසකට මුහුණ දෙමින් ජීවත්වනු හඳුනාගත හැකි විය.

*'මගේ නම සිරිසේන. මට වයස අවුරුදු 78ක් වෙනවා. මගේ බිරිඳත් හදිසි අනතුරකින් මිය ගියා. මං ජීවත් වෙන්නේ බාල පුතා ලඟයි. පුතාටත් දරුවන් දෙදෙනක් සිටිනවා. පුතා කුලී වැඩ කරලයි ජීවත් වෙන්නේ. මට ජීවත් වෙන්න ස්ථිර ආදායමකුත් නැහැ. නමුත් මට වැඩිහිටි දීමනාව ලැබෙනවා. මට ඇවිද ගන්න බැරිව ඇඳට වේලා දැන් අවුරුදු 07ක් පමණ වෙනවා. ඒ හින්දා වැඩිහිටි නිලධාරී මාර්ගයෙන් මට ලැබෙන දීමනාව ගන්න කෙනෙක් හැටියට මං මගේ පුතා පත් කළා. ඒ මුදලත් වියදම් කරගන්නේ පුතායි. මට ලැබෙන්නේ නැහැ.'*

***ගැඹුරු සම්මුඛ සාකච්ඡාව, 2024***

මෙම ප්‍රතිචාරක අදහස් තුළින් පෙනීයන්නේ වැඩිහිටියන්ට ස්ථිර ආදායම් මාර්ගයන් නොමැති වීමත්, සෞඛ්‍ය ගැටලු බලපෑම හේතුවෙන් ඔවුනට ලැබෙන සුභසාධන දීමනා වෙත ප්‍රවේශයන් නොමැතිකම නිසා වැඩිහිටියෙකු හට මුහුණ දීමට සිදු වී ඇති ගැටලුකාරී තත්ත්වයේ ස්වභාවයයි. ක්ෂේත්‍ර අධ්‍යයනය තුළ දී වඩාත් ගැඹුරින් අනාවරණය කරගැනීමට හැකි වූ කාරණයක් වූයේ සෞඛ්‍ය ගැටලු හේතුවෙන් අසරණ වූ බොහෝ වැඩිහිටියන්ගේ විශ්‍රාම මෙන්ම අනෙකුත් සුභසාධන ප්‍රතිලාභ ලබාගැනීමට ඔවුනට වන අපහසුතාවය හේතුවෙන් ඒවා ලබාගැනීමට වෙනත් පාර්ශවයකට බලය පවරා තිබීමයි. එම බලය පවරන ලද පාර්ශවයන් විසින් විශ්‍රාම හා අනෙකුත් සියලු හිමිකම් පරිහරණය කරනු ලබන තත්ත්වයක් තුළ එහි නියම ප්‍රයෝජන අත් කරගැනීමට වැඩිහිටියන්ට නොහැකි වී තිබේ. එමෙන්ම පවුලේ එක් දරුවකු විසින් සිය වැඩිහිටියන්ට හිමි හිමිකම් පරිහරණය කරනු ලබන තත්ත්වයක් තුළ සෙසු සහෝදර සහෝදරියන් අතර මතභේද වර්ධනයට තුඩදු දී ඇති සාධකයක් වී තිබේ. මේ හේතුවෙන් වැඩිහිටියන්ට පවුලේ සෙසු දරුවන්ගේ ආදරය හා රැකවරණය අවම ලැබීමට එය හේතු කාරණයක් වී තිබෙණු ද තවදුරටත් අනාවරණය කරගත හැකි විණ.

### 5.1.4 වැඩිහිටියන්ගේ ඉතුරුම් ස්වභාවය

**වගු අංකඃ 2.0 ග්‍රාමීය හා නාගරික ජීවත්වන වැඩිහිටියන්ගේ මාසික ඉතුරුම් ස්වභාවය**

| ඉතුරුම් (රු.) | ග්‍රාමීය | නාගරික | එකතුව | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| ඉතුරුම් නැත | 172 | 68 | 240 | 69.0 |
| 2500 අඩු | 25 | 29 | 54 | 15.0 |
| 2501-5000 | 12 | 16 | 28 | 8.0 |
| 5001-7500 | 05 | 09 | 14 | 4.0 |
| 7501-10000 | 03 | 04 | 07 | 2.0 |
| 10000 වැඩි | 03 | 04 | 07 | 2.0 |
| **එකතුව** | **220** | **130** | **350** | **100.0** |

**මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, 2024**

නියැදිය තුළ ජීවත්වන වැඩිහිටියන් අතර ඉතුරුම් පවත්වාගෙන යෑම අවම මට්ටමක පවතී. සමස්ත නියැදියෙහි ජීවත්වන වැඩිහිටියන් බහුතරයක් ඉතිරි කිරීම් නොමැති අයවලුන් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 69.0% ප්‍රමාණයකි. සිය මාසිකව ලබන ආදායමෙන් ඉතිරි කිරීම් පවත්වා ගෙනයන වැඩිහිටියන් සමස්ත නියැදියේ ප්‍රතිශතයක් වශයෙන් 31.0% ප්‍රමාණයකි. ඉතිරිකිරීම් පවත්වාගෙන යෑමට හැකියාවක් නැති වැඩිහිටියන් අතරට සිය දරුවන් මෙන්ම ඥාතී හිතෛෂීන් යටතේ දිවි ගෙවන වැඩිහිටියන්, රජයේ සුභසාධන ප්‍රතිලාභ හිමිකම් ලබන වැඩිහිටියන්, රැකියාවන්හි නියුතු හා විශ්‍රමික වැඩිහිටියන් ඇතුළත් වී තිබීම සුවිශේෂීත්වයකි. නියැදිය තුළ ග්‍රාමීය හා නාගරික වශයෙන් ජීවත්වන වැඩිහිටියන්ගේ ඉතුරුම් ස්වභාවයන් පිළිබඳ සළකා බැලීමේ දී ග්‍රාමීය වශයෙන් ජීවත්වන ස්ත්‍රී-පුරුෂ වැඩිහිටියන්ට සාපේක්ෂව නාගරික වශයෙන් ජීවත්වන ස්ත්‍රී-පුරුෂ වැඩිහිටියන් තරමක් දුරට ඉතුරුම් පවත්වාගෙන යන ස්වභාවයක් හඳුනාගත හැකි විණ. ග්‍රාමීය වශයෙන් ජීවත්වන වැඩිහිටියන් අතුරින් 78.0% ක ප්‍රතිශතයක් හා නාගරික වශයෙන් ජීවත්වන වැඩිහිටියන් අතුරින් 52.0% ක ප්‍රතිශතයක් මාසික ඉතුරුම් නොපවත්වා ගෙනයන වැඩිහිටියන් වන අතර, ග්‍රාමීය ජීවත්වන වැඩිහිටියන් අතුරින් 22.0%ක ප්‍රතිශතයක් හා නාගරික වශයෙන් ජීවත්වන වැඩිහිටියන් අතුරින් 48.0% එහි දී ඉතුරුම් පවත්වාගෙන යනු ලබයි. නාගරික අංශය තුළ ජීවත්වන වැඩිහිටියන්ට සාපේක්ෂව ග්‍රාමීය අංශයේ ජීවත්වන වැඩිහිටියන්ගේ ඉතුරුම් පහළ යෑමට බලපෑ තිබෙන සුවිශේෂී සාධකන් වී ඇත්තේ ග්‍රාමීය ජීවත්වන වැඩිහිටියන්ගේ අධ්‍යාපන මට්ටම පහළ ස්වභාවයක් ගැනීම, ග්‍රාමීයව ජීවත්වන වැඩිහිටියන් බහුතරයක් අවිධිමත් ක්ෂේත්‍රයන්ට අයත් රැකියාවන්හි යෙදීම හා විරැකියාව, ඔවුන් බහුතරයක් තවමත් සිය දූ දරුවන් හා ඥාතී හිතෛෂීන් මත යැපීම හා ඉතුරුම් සංස්කෘතියක්

පවත්වාගෙන යෑමට මානසික වශයෙන් සවිබලගැන්වී (Mentally Empowermant) නොතිබීම යන හේතු කාරණයන් වේ. වැඩිහිටියන්ට මාසික ඉතුරුම් ප්‍රමාණවත් තරම් පවත්වා ගැනීමට නොහැකි වීමෙන් මුල්‍ය දුෂ්කරතාවයන් මෙන්ම ඔවුනගේ ජීවන රටාව තුළ විවිධ ආර්ථික ගැටලු හා අභියෝග පැණ නැගීමට එය වී තිබෙනු හඳුනාගත හැකි විණ.

### 5.1.5 ආර්ථික සහයෝගීතාවය

අධ්‍යයන නියැදියෙහි ජීවත්වන වැඩිහිටියන් බහුතරයක් ආර්ථිකමය වශයෙන් සිය ගෘහ ආශ්‍රිත සමාජිකයින්ගේ සහයෝගයක් නොලැබීම තුළ ආර්ථික අනාරක්ෂිතභාවයකට පත් වී සිටී. මර්ඩොක් විසින් පෙන්වා දෙන පරිදි විශ්වීය මානව පවුලේ කෘත්‍යාත්මක විග්‍රහයෙහි දැක්වෙන ආර්ථික සහයෝගීතාවය (Economic Cooperation) පවුල් සංස්ථාවේ පැවැත්ම හා ක්‍රියාකාරිත්වය විෂයෙහි අත්‍යාවශ්‍ය අංගයක් වශයෙන් බෙහෙවින් වැදගත්ය. හේමන්තකුමාර (2017) අනුව ඕනෑම පවුල් සංස්ථාවක් පවත්වාගෙන යෑම සඳහා ආර්ථික පදනමක් පැවතීම අත්‍යවශ්‍ය සාධකයකි. එමෙන්ම පවුලේ සියලු සමාජිකයින්ගේ ආර්ථික අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා ආර්ථික ශක්තියක් ගොඩනගා ගැනීමට කටයුතු කිරීම පවුලට අත්‍යවශ්‍ය කාරණයක් ද වේ (හේමන්තකුමාර,2017,පි.112). ගැඹුරු සම්මුඛ සාකච්ඡා මඟින් විශ්ලේෂිත දත්තයන්ට අනුව පෙනීගියේ වත්මන් පවුල් සංස්ථාව තුළ ආර්ථික සහයෝගීතාවය අභියෝගයට ලක් වී තිබෙන සමාජ පසුබිමක, වැඩිහිටියන්ට ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වී තිබෙන බවයි.

*'මම නමින් කරුණාදස. මට වයස අවු: 67. අපි ගොවිතැන් බතක් කරලා තමයි ජීවත් වෙන්නේ. මට පුතාලා දෙදෙනෙක් සිටිනවා. ඔවුනට මේ කර්මාන්තය කරන්න කිසිදු උනන්දුවක් තියා අපි කරන වැඩකට උදව්වක්වත් වෙන්නෙත් නැහැ. වෙන රැකියා කරන්න සොයනවා. අපට ජීවත් වෙන්න තියෙන්නේ මේ කර්මාන්තය විතරයි. ඒ හින්දා දරුවන්ගෙන් උදව්වක් නැති උනත් අපි අමාරුවෙන් හරි මේ කර්මාන්තය කරගෙන යනවා'.*

***ගැඹුරු සම්මුඛ සාකච්ඡාව, 2024***

මෙම ප්‍රතිචාරක අදහස් අනුව පෙනීයන්නේ වැඩිහිටියන්ට ආර්ථික කටයුතු සඳහා කුටුම්භයේ සෙසු සමාජිකයින්ගේ සහයෝගය නොලැබීම තුළ ඔවුන් විවිධ අපහසුතාවයන්ට පත් වී තිබෙන ආකාරයයි. සිය ජීවන ක්‍රියාවලිය පවත්වාගෙන යෑමට තමන්ට ඇති එකම කර්මාන්තය කිරීමට දරුවන්ගේ උදව්වක් නොලැබෙන පසුබිමෙක ඔවුනට එය සුවිශාල අභියෝගයක් බවට පත් වී තිබේ. සාහිත්‍ය අනාවරණය තුළින් පැහැදිලි වු අන්දමට ලාංකේය සමාජ සන්දර්භය තුළ වන විස්තාරික පවුල තුළින් පවුලේ සමාජිකයින්ගේ දිවි පෙවෙත සහතික කරන්නා වශයෙන් පවුලේ වැඩිහිටි දෙමාපියන්ට සෙසු සමාජිකයින්ගේ සහයෝගය ලැබී ඇත. මේ හේතුවෙන් පවුල ස්වංපෝෂිත එකක් වු අතර, පවුලක වැඩිහිටියාට සවිමත් ආර්ථික රැකවරණයක් ද දරුවන්ගෙන් ලැබි තිබුණි. නමුත් වත්මන් පවුල් සංස්ථාව තුළින් මෙකී කෘත්‍යාත්මක වගකීම් ඉටු නොවීම වැඩිහිටියාගේ ජීවන පැවැත්ම විෂයෙහි එය සුවිශේෂී වශයෙන් බලපෑමක් සිදු කර තිබේ.

*'මගේ නම ප්‍රේමවතී. මට වයස අවු:62. මගේ ගෙදර පොඩි පුතාත් ලේළිත් සිටිනවා. පුතාත් ලේළිත් තමයි පවුලේ මුදල් හදල් සම්බන්ධයෙන් තීන්දු ගන්නේ. ඔවුන් ගන්න තීරණයකට එකඟවෙන එක විතරයි මට කරන්න තියෙන්නේ. ඔවුන්ට ඕනෑ විදියට කරගන්න ඉඩ දෙනවා හැරෙන්න මම ඒවාට ඇඟිලි ගහන්න යන්නේ නැහැ'*

***ගැඹුරු සම්මුඛ සාකච්ඡාව, 2024***

මෙම ප්‍රතිචාරක අදහස් අනුව තවදුරටත් සනාථ වන්නේ පවුලක ආර්ථික කටයුතු සම්බන්ධව තීන්දු තීරණ ගන්නා ක්‍රියාවලිය තුළ දරුවන් විසින් වැඩිහිටි දෙමාපියන් නොසළකා හැර කටයුතු කොට තිබෙන බවයි. පෞද්ගලිකත්වය ඉස්මතු වූ ආර්ථික රටාව හේතුවෙන් ගෘහ කුටුම්භ සංස්කෘතියේ ආර්ථික සහයෝගීත්වයට මෙමඟින් බලපෑමක් සිදු වී තිබේ. පවුලක ආර්ථිකමය වශයෙන් තීන්දු තීරණ ගනු ලබන ක්‍රියාවලිය තුළින් වැඩිහිටියා ගිලිහී ගොස් හුදෙකලා වීමට සිදු වීමෙන් ආර්ථික අනාරක්ෂිතභාවයකට පත් වී ඇත. අධ්‍යයන අනාවරණයන්ට අනුව තවදුරටත් පැහැදිලි වූයේ සමාජ වෙනස්වීමට සාපේක්ෂව නූතන පරම්පරාව විසින් වැඩිහිටියන්ගේ පාරම්පරික කර්මාන්ත ප්‍රතික්ෂේප කිරීම, නව රැකියා කර්මාන්ත හා අවස්ථාවන් සඳහා තරුණ ප්‍රජාව දක්වන රුචිකත්වය, නව රැකියා අවස්ථා සොයමින් දෙමාපියන් හුදකලා කර නාගරික වශයෙන් සීඝ්‍රව සිදුවන තරුණ සංක්‍රමණ හා පවුල තුළ කාන්තා කාර්යභාර්යේ වෙනසියාවන් හේතුවෙන් පවුලේ වැඩිහිටියාට ලැබෙන ආර්ථික සහයෝගය අවම වීමට එය හේතු සාධකයන් වී තිබෙන බවයි. මර්ඩොක් විසින් ඉදිරිපත් කර ඇති පවුලක විශ්වීය වශයෙන් ඉටුවෙන කෘත්‍යයක් වන 'ආර්ථික සහයෝගීතාවය' (Economic cooperation) වත්මන් ගෘහ කුටුම්භ පරිසරය තුළ අභියෝගයට ලක් වී ඇති අතර, පවුලක ජීවත්වන වැඩිහිටි සමාජිකයින්ගේ ආර්ථික තත්ත්වය තීරණය විමෙහිලා එය බලපෑමක් වී තිබේ.

#### 6.3.1.6 වැඩිහිටි සුභසාධන ආධාර

වැඩිහිටි ජීවන තිරසරභාවය කෙරෙහි වැඩිහිටියන්ට ලැබෙන සුභසාධන ආධාර ස්වභාවය බලපාන අතර, එහි ප්‍රමාණාත්මකභාවය අවම වීම ආර්ථික ගැටලු ඇතිවීමට හේතුවකි. අධ්‍යයන නියැදිය තුළ ජීවත්වන නාගරික හා ග්‍රාමීය සමාජ පසුබිම තුළ දිවි ගෙවන රජයේ සුභසාධන ආධාර හිමිකම් ලබන වැඩිහිටියන් අතුරින් 18%ක ප්‍රතිශතයක් මහජන ආධාර දීමනා හිමිකම් ලබන්නන් වේ. වැඩිහිටි දිමනාව ලබන වැඩිහිටියන් ප්‍රමාණය 56% ප්‍රතිශතයකි. ඔවුන් අතුරින් වැඩි ප්‍රතිශතයක් ග්‍රාමීය සමාජයට අයත් වූවන් වේ. එමෙන්ම නියැදිය තුළ ජීවත්වන සමෘද්ධි ප්‍රතිලාභ හා පිං පඩි දීමනාවට හිමිකම් කියන වැඩිහිටියන් සංඛ්‍යාව ප්‍රතිශතයක් වශයෙන් පිළිවෙලින් 17% හා 9.0% ප්‍රමාණයක් වේ. රජයේ සුභසාධන දීමනා හිමිකම් ලබන මෙම වැඩිහිටියන්ට ලැබෙන දීමනාවන් ප්‍රමාණවත්කම පිළිබඳ ඔවුනගේ මතය විමසිමේ දී තහවුරු වූයේ වැඩිහිටින් අතුරින් 96% ප්‍රතිශතයක් තමන්ට ලැබෙන ආධාර හිමිකම පිළිබඳ කිසිසේත් සෑහීමකට පත් නොවන බවයි. එම හිමිකම් තමන්ට ප්‍රමාණවත් බව ප්‍රකාශ කර සිටින වැඩිහිටියන් ප්‍රතිශතයක් ලෙස 4.0%ක ප්‍රමාණයක් වූ අතර, අධ්‍යයන නියැදිය තුළ සිය දරුවන්

හා ඥාතීන් යටතේ දිවි ගෙවන තවත් වැඩිහිටියන් 35.0%ක ප්‍රමාණයකට මෙම හිමිකම් ලැබිය යුතු මට්ටමක ඔවුනගේ ආර්ථික තත්ත්වය පවත්නා බැව් නිරීක්ෂණය කරගත හැකි විය.

**සමාලෝචනය හා නිගමනය**

වැඩිහිටි ප්‍රජාව මුහුණ දෙන සමාජ-ආර්ථික ගැටලු හා අභියෝග සඳහා බලපා අති ප්‍රධාන සාධකයක් වී ඇත්තේ වැඩිහිටියන්ට මූල්‍ය ප්‍රාග්ධන ප්‍රවේශතාවයේ පවත්නා සීමස්ථ තත්ත්වයන් වේ. මේ හේතුකොට ගෙන ආර්ථික අනාරක්ෂිතභාවයට වැඩිහිටි ප්‍රජාවට මුහුණ දීමට සිදු වී තිබේ. වැඩිහිටියන් බහුතරයක් විධිමත් ක්ෂේත්‍රයන් තුළ රැකියාගත නොවීමත්, අදායම් මූලාශ්‍රයන් නොමතිකම තුළ මාසික ආදායම් ප්‍රමාණවත් නොවීම, ඉතුරුම් සංස්කෘතියකට හුරු නොවීම, ගෘහ කුටුම්භ කේන්ද්‍ර ආර්ථික සහයෝගීතාවය බිඳ වැටී තිබීම යන කාරණාවන්ගේ ප්‍රතිඵලය වැඩිහිටි ප්‍රජාව තුළ ආර්ථික අනාරක්ෂිතභාවයක් ඇතිවීමට බලපෑ හේතු කාරණා තිබේ. එබැවින් වැඩිහිටි ප්‍රජාවේ ආර්ථික ගම්‍යවීම්, ගැටලු හා අභියෝග පිළිබඳව සාකච්ඡා කෙරෙන සමාජ කතිකාවතක් ඇති කිරීමට පියවර ගැනීම කාලීනය. වැඩිහිටි ප්‍රජාව මුහුණ දෙන ආර්ථික ගැටලු හා අභියෝග සමාජ වෙනස්වීමට සාපේක්ෂව වන බැවින්, කලානුක්‍රමිකව ඒ පිළිබඳ සොයාබැලෙන සමීක්ෂණ සිදු කිරීමත් කළ යුතු වේ. දිළිඳුකම තුරන්කිරීම සඳහා සිදු කෙරෙන ජාතික වැඩසටහන් හා ව්‍යාප්තීන් තුළ දී වැඩිහිටි ප්‍රජාව වඩාත් අවධානම් පාර්ශවයක් වශයෙන්, ඔවුන් අතර සිටින ස්ත්‍රී, මහළුතම හා ආබාධ සහිත වැඩිහිටියන්ගේ ජීවන තත්ත්වයන් පිළිබඳ සුවිශේෂී අවධානයක් යොමු කිරීමත් වැදගත්ය. වැඩිහිටි ප්‍රජාව මුහුණ දෙන සමාජ-ආර්ථික ගැටලු අවම කිරීම සඳහා පවුල, ඥාතීත්වය හා පරම්පරා අතර සහයෝගීතාවය අතිශය තීරණාත්මක සාධකයක් වන බැවින්, එය ප්‍රවර්ධනයට පවත්නා ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය කරමින් පරම්පරා අතර අන්‍යෝන්‍ය හා ඵලදායි හුවමාරුව ප්‍රවර්ධනය කිරම අරමුණු කරගත් මූල පිරීම් මෙහි දී වැදගත්ය. වැඩිහිටි ප්‍රජාවේ ආර්ථික අනාරක්ෂිතභාවය තුරන් කරළීමට රැකියා අවස්ථා, ස්වං රැකියා, ආදයම් උත්පාදනය, ණය, වෙළඳපල හා වත්කම් සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවයකින් තොරව සමාන අවස්ථාවන් සහතික කළ යුතුය. වැඩිහිටි ප්‍රජාව මුහුණ දෙන ආර්ථික ගැටලු විසඳාගැනීමේ දී එක් උපායමාර්ගික ප්‍රවේශයක් වශයෙන් වැඩිහිටියන් සංවර්ධන ක්‍රියාවලියට සහභාගී කරවා ගැනීමට පියවර ගැනීමත්, ඒ සඳහා පවත්නා බාධක හඳුනාගැනීමට පියවර ගැනීමත් වැඩිහිටි ප්‍රජාව කිසිදු කාර්යාත්මක හැකියාවක් නොමැති යැපෙන්නන් සේ නොසළකා, ක්‍රියාශීලිව ආර්ථිකයට දායක කරගැනීම තුළ ඔවුනගේ ජීවන තිරසාරත්වය ලඟා කරගැනීමට අවස්ථාව සැළසීමට හැකියාව ලැබේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


සිද්ධිසේන, කේ.ඒ.පී. (2004). *ශ්‍රී ලංකාවේ ප්‍රජා විද්‍යානුකූල වයස්ගතවීම*. ශ්‍රී ලංකාවේ වයස්ගතවීමේ ජනගහනයඃ ගැටලු සහ අනාගත අපේක්ෂාවන්. කොළඹ: එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල. 10-45

සුමනසේකර, එස්. (2004). *ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා වයස්ගතවීම*. කොළඹ 07: එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල. ශ්‍රී ලංකාවේ වයස්ගතවීමේ ජනගහනය: ගැටලු හා අනාගත අපේක්ෂාවන් කොළඹ: එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල. 118-146

පතිරගේ, ජේ.එම්. (2013) *"ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාව වියපත්වීම ආර්ථිකයට අහිතකරනු ලබන බලපෑම"* කොළඹ 10ඃ සි/ස ඇස් ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

දිසානායක, පි.කේ.එම්. (2021). *වියපත්විය හා විශ්‍රාම සංක්‍රාන්තියඃ පශ්චාත් විශ්‍රාම දිවිය හා බැඳුණු නිශේධනීය අත්දැකීම්.* ප්‍රතිමාන ශාස්ත්‍රීය සඟරාව. රුහුණ විශ්වවිද්‍යාලයඃ සමාජ විද්‍යා අධ්‍යානාංශය. *14,* 12-22.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව. (2000). *වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ පනත.* කොළඹඃ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව. 1-28

Amiri, M. (2018). Problems faced by old age people. The International Journal of Indian Psychology, 6(3), Article ID not available, ISSN 2348-5396.

Barrintotos, A., Gorman, M., & Help, A. (2003). *Old Age Poverty in Developing Countries:Contributions and Dependence in Late Life.* Research Gate. https://doi.org/10.1016/S0305-750X(02)00211-5

Benserson, M., & Mertlock, C. (2007). *The Elderly & Development: A Field Study on Elderly People's Livelihood*. Vaxjo University: School of Social Sciences.

Manike, H. R. A. (2016). *Socio-economic issues of elderly population in Sri Lanka: A comparison between rural and urban sectors*. International Journal of Economics, Commerce and Management, *1*, 525-540.

United Nations. (2005). *World Population Prospects*: The 2004 Revision, Vol. *1*. Comprehensive Tables. New York: United Nations.

Yaseen, M., & Zaman, S. (2017). *A sociological study of the socioeconomic problems of elderly people in Karachi.* AESS Publication, 608-618.